ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

**අදියර II විභාගය - 2021 ජූලි**

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

---

## A කොටස

**ප්‍රශ්න අංක 01**

මෙය ලකුණු 25ක අනිවාර්ය ප්‍රශ්නයකි. සම්පූර්ණ විෂය නිර්දේශයම ආවරණය වන පරිදි මෙම ප්‍රශ්නය නිර්මාණය කර තිබේ. මුළු ලකුණු ලබා ගැනීමට සමත් වූයේ ඉතාමත් සුළු සංඛ්‍යාවක් පමණි.

**පිළිතුරු ඇගයීමේදී පහත දුර්වලතා නිරීක්ෂණය විය:**

**1.1** පිරිවැය ගිණුම්කරණය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක්දැයි විමසා තිබුණි. බොහෝ අපේක්ෂකයන් නිවැරදි පිළිතුර සපයා තිබුණි.

**1.2** LKAS 10 පිළිබඳ දැනුම මෙමගින් පරීක්ෂා කර තිබුණි. බොහෝ අපේක්ෂකයන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**1.3** දී ඇති දත්ත භාවිතා කරමින් යම් මාසයක විකුණුම් අගය ගණනය කිරීම පිළිබඳ දැනුම මෙමගින් පරීක්ෂා කර තිබුණි. බොහෝ අපේක්ෂකයින් නිවැරදිව පිළිතුරු සපයා තිබූ අතර පිළිතුරු සැපයීමට අසමත්ව තිබුණේ සුළු පිරිසකි.

**1.4** දී ඇති දත්ත අනුව පස්වන වසර අවසානයේදී මෝටර් රථයේ ධාරණ අගය ගණනය කළ යුතු විය. බොහෝ අපේක්ෂකයන් 2021 මාර්තු 31 දිනට ධාරණ අගය නිවැරදිව ගණනය කර තිබූ නමුත් සමහර අය එදිනට ධාරණ අගය ගණනය කිරීමට අසමත්ව තිබුණි.

**1.5** දී ඇති දත්ත හා සූත්‍රය භාවිතයෙන් ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) ගණනය කළ යුතු විය. සමහර අපේක්ෂකයන් EOQ නිවැරදිව ගණනය කර තිබූ නමුත් සමහරු ඊට අසමත් විය. සමහර අපේක්ෂකයන්ගේ ගණිතමය දැනුම ඉතා දුර්වල බව නිරීක්ෂණය විය.

**1.6** ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාරයකට අදාළ වන නීති/ රීති 2ක් ලැයිස්තුගත කිරීමට අවශ්‍ය විය. බොහෝ අපේක්ෂකයන් හවුල් ව්‍යාපාරයකට අදාල වන නීති/ රීති 2ක් ලැයිස්තුගත කිරීමට අසමත්ව තිබූ අතර බොහෝ අය හවුල් ගිවිසුමකට අදාළ වන තොරතුරු සඳහන් කර තිබුණි.

**1.7** සංකලිත ගිණුම්කරණ පද්ධතියක වාසි 2ක් සඳහන් කළ යුතු වූ අතර බොහෝ අපේක්ෂකයන් පිළිතුරු සැපයීමට අසමත්ව සිටියහ. ඉතා සුළු පිරිසක් පමණක් පිළිතුරු සපයා තිබුණි.

**1.8** සීමිත පෞද්ගලික සමාගමක සිටිය යුතු උපරිම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව සහ අවම කොටස්කරුවන් සංඛ්‍යාව සඳහන් කළ යුතු විය. බොහෝ අපේක්ෂකයන් අවම කොටස්කරුවන් සංඛ්‍යාව නිවැරදිව සඳහන් කර තිබූ නමුත් 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සීමිත පෞද්ගලික සමාගමක සිටිය යුතු උපරිම අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාව සඳහන් කිරීමට බොහෝ අය අසමත්ව තිබුණි.

1.9 දී ඇති දත්ත භාවිතයෙන් සේවකයකුගේ මුළු ඉපැයීම් ගණනය කළ යුතුවූ අතර බොහෝ අපේක්ෂකයන් මුළු ඉපැයීම් වෙනුවට ගණනය කර තිබුණේ දිරි දීමනාවයි.

1.10 දී ඇති දත්ත භාවිතයෙන් VAT පාලන ගිණුම පිළියෙළ කළ යුතු වූ අතර බොහෝ අපේක්ෂකයන් එය පිළියෙළ කර තිබුණි. ඉතා සුළු පිරිසක් VAT පාලන ගිණුමේ හර හා බැර සටහන් මාරුකර දක්වා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

කේවල ස්වාමී ව්‍යාපාරයක අසම්පූර්ණ මූල්‍ය තොරතුරු පදනම් කර ගනිමින් ශේෂ පිරික්සුම පිළියෙළ කළ යුතු විය. ගැනුම් සහ විකුණුම් සම්බන්ධ ගැලපුම් පිළිබඳව බොහෝ අපෙක්ෂකයන් තේරුම්ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, සමහර අපේක්ෂකයන්, ආරම්භක ප්‍රාග්ධනය නිවැරදිව හඳුනා ගැනීමට අසමත්ව තිබූ අතර ශේෂ පිරික්සුම වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ ආදායම් ප්‍රකාශය පිළියෙළ කර තිබුණි. බැංකු ණය පොලිය නිවැරදිව ගණනය කර නොතිබුණි. එසේම සමහර අපේක්ෂකයන් ශේෂ පිරික්සුම වෙනුවට ලෙජර් ගිණුම් පිළියෙළ කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

### ප්‍රශ්න අංක 03

මෙමගින් හවුල් ව්‍යාපාර ගිණුම් පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කර තිබූ අතර හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම සහ ජංගම ගිණුම පිළියෙළ කළ යුතු විය. හවුල් ව්‍යාපාර පිළිබඳ මූලික දැනුම මඳ බව නිරීක්ෂණය විය. ප්‍රාග්ධන ගිණුමේ හා ජංගම ගිණුමේ සටහන් පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොතිබුණි.

**පහත දැක්වෙන පොදු දුර්වලතා නිරීක්ෂණය විය:**

- සමහර අපේක්ෂකයන්, කීර්තිනාමය හා වත්කම් ප්‍රත්‍යාගණන ලාභය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුමෙහි වෙනුවට ජංගම ගිණුමේ ගලපා තිබුණි.
- ඉතා සුළු පිරිසක් ප්‍රාග්ධන පොලී, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුමේ ගලපා තිබුණි.
- නව හවුල්කරු වූ **මීනාගේ** ප්‍රාග්ධනය මත පොලිය ගණනය කර නොතිබුණේ ඉතා සුළු පිරිසකි.
- සමහර අපේක්ෂකයන්, ප්‍රත්‍යාගණන ලාභය නව හවුල්කරුටද ගලපා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

ලාභ අපේක්ෂා නොකරන සංවිධානයක ආදායම් ප්‍රකාශය පිළියෙළ කිරීම පිළිබඳ දැනුම මෙහිදී පරීක්ෂා කරන ලදී.

**නිරීක්ෂණය කළ පොදු දුර්වලතා පහත දැක්වේ:**

- සමහර අපේක්ෂකයන් ආරම්භක තොගය වෙනුවට අවසාන තොගය ගැනුම් වලට එකතු කර තිබුණි.
- ණයහිමි පාලන ගිණුමට හර බැර සටහන් වැරදියට තැබීම නිසා නිවැරදි ගැනුම් වටිනාකම පෙන්වා නොතිබුණි.
- සාමාජික මුදල් ගිණුම නිවැරදිව පිළියෙළ කර නොතිබූ අතර හර හා බැර සටහන් නිසියාකාරව හඳුනාගෙන නොතිබුණි.
- ලැබීම් ගෙවීම් ගිණුමේ දක්වා තිබූ සාමාජික මුදල් අගයම ආදායම් හා වියදම් ගිණුමේ වර්ෂය සඳහා සාමාජික මුදල් ලෙස සලකා තිබුණි.
- සමහර අපේක්ෂකයන් ආදායම් හා වියදම් ගිණුම හා ආපනශාලා වෙළඳ ගිණුම වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කර තිබුණි.
- සමහරු ක්‍රීඩා භාණ්ඩ මිලට ගැනුම්, ආදායම් හා වියදම් ගිණුමට ගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

**(A)** **(a)** බොහෝ අපේක්ෂකයන්, එක් ටී´ෂර්ටයක පිරිවැය නිවැරදිව ගණනය කර තිබුණි. නමුත්, සුළු පිරිසකට ගණිතමය වැරදි නිසා වැරදි පිළිතුරු ලැබී තිබුණි.

**(b)** බොහෝ අපේක්ෂකයන් ටී´ෂර්ට් ඇණවුමේ ලාභය ගණනය කර තිබූ අතර සමහරුන්ට විවිධ වැරදි පිළිතුරු ලැබූ තිබුණි.

**(B)** **(a)** සමහර අපේක්ෂකයන් අමුද්‍රව්‍ය තොග පාලන ගිණුම නිවැරදිව පිළියෙළ කර තිබූ අතර සමහර අපේක්ෂකයන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා නොතිබුණි. සමහර අපේක්ෂකයන් ගිණුමේ වැරදි පැත්තේ ගනුදෙනු සටහන් කර තිබුණි.

**(b)** සමහර අපේක්ෂකයන් නොනිමි වැඩ පාලන ගිණුම සතුටුදායක මට්ටමකින් පිළියෙළ කර තිබූ අතර සමහර අපේක්ෂකයන්, වැරදි පැත්තේ සටහන් කිරීම, සමහර සටහන් සම්පූර්ණයෙන් අමතක කර තිබීම වැනි කරුණු නිසා නොනිමි වැඩ පාලන ගිණුම නිවැරදිව පිළියෙළ කිරීමට අසමත්ව තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

පොදුකාර්ය විභජනය කිරීම පිළිබඳ මූලික දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබේ. දී ඇති තොරතුරු ඇසුරින් පොදුකාර්ය විභජන ප්‍රකාශයක් පිළියෙළ කිරීම **(a) කොටසින්** අපේක්ෂා කෙරිණි. බහුතරයක් අපේක්ෂකයන්, **(a) කොටසට** සතුටුදායක මට්ටමකින් පිළිතුරු සපයා තිබුණි. **(b)** සහ **(c) කොටසට** පිළිතුරු සැපයීම සතුටුදායක මට්ටමක නොතිබුණි. බොහෝ අපේක්ෂකයන් නිෂ්පාදන හා ඇසුරුම් අංශ සඳහා පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතය නිවැරදිව ගණනය කිරීමට අපොහොසත්ව සිටි අතර එනිසා ඇස්තමේන්තුගත මුළු පිරිවැය සඳහා වැරදි අගයන් නිරීක්ෂණය විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## C කොටස

## ප්‍රශ්න අංක 07

**(a)** හා **(b)** වශයෙන් කොටස් 2කින් සමන්විත වූ මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලද්දේ සීමිත පෞද්ගලික සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමයි. **(a) කොටසින්** විස්තීරණ ආදායම් ප්‍රකාශය පිළියෙළ කිරීමද **(b) කොටසින්** මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කිරීමද අවශ්‍ය විය.

බොහෝ අපේක්ෂකයින් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබූ අතර ඉතා සුළු පිරිසක් මුළු ලකුණු ලබාගැනීමට සමත් විය.

පහත දැක්වෙන දුර්වලතා නිරීක්ෂණය කරන ලදී:

**(a) <u>විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීම:</u>**

(1) සමහර අපේක්ෂකයන් ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා පොදුවේ පිළිගත් ආකෘති භාවිතා කර නොතිබුණි.

(2) සමහර අපේක්ෂකයන් ණයකර පොලිය නිවැරදිව ගණනය කර නොතිබුණි. තවත් සමහරු ගෙවූ ණයකර පොලිය විස්තීරණ ආදායම් ප්‍රකාශයට ගෙන තිබුණි.

(3) උපචිත වියදම් හා ඉදිරියට ගෙවූ වියදම් නිවැරදිව පෙන්වා නොතිබුණි.

(4) සමහර අපේක්ෂකයන් ක්ෂය සඳහා ප්‍රතිපාදන කර නොතිබුණි.

(5) සමහර අපේක්ෂකයන් පෙරවැඩ අමුණා නොතිබුණි. එම නිසා ගණනය කිරීම් නිවැරදි නොවූ විට පෙරවැඩ සඳහා ලකුණු ලබා ගැනීමේ අවස්ථාව ඔවුනට නොලැබුණි.

(6) බොහෝ අපේකෂකයන් අවසාන තොගය නිවැරදිව ගලපා නොතිබුණි.

(7) බොහෝ අපේක්ෂකයන් මෝටර් රථ විකිණීමේ ලාභය නිවැරදිව ගණනය කර නොතිබුණු අතර මෝටර් රථ ගිණුම, සමුච්චිත ක්ෂය ගිණුම හා මෝටර් රථ ඉවත් කිරීමේ ගිණුම යන ගිණුම් වල අවශ්‍ය ජර්නල් සටහන් ඇතුළත් කර නොතිබුණි.

(8) සමහර අපේක්ෂකයන් සමහර අගයන් දහස් ගණනින්ද සමහර අගයන් දහස් ගණනට වැටයීමෙන් තොරවද පෙන්වා තිබුණි.

(9) සමහර අපේක්ෂකයන් පරිපාලන වියදම් හා බෙදා හැරීමේ වියදම් සඳහා විස්තරාත්මක පෙරවැඩ පෙන්වා නොතිබුණි.

**(b)** <u>**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කිරීම:**</u>

(1) සමහර අපේක්ෂකයන් ශුද්ධ උපලබ්ධි අගය (NRV) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ගෙන නොතිබුණි.

(2) සමහර අපේක්ෂකයන් ලැබිය යුතු රක්ෂණ වන්දි ජංගම වත්කම් යටතේ පෙන්වා නොතිබුණි.

(3) සමහරු ඉදිරියට ගෙවූ ප්‍රචාරණය, ගෙවිය යුතු විගණන ගාස්තු සහ උපචිත ණයකර පොළී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් කොට නොතිබුණි.

(4) සමහර අපේක්ෂකයන් වෙළඳ ලැබිය යුතු මුදල් වලින් බොල්ණය සඳහා ප්‍රතිපාදන අඩුකර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

- - -

**විභාගයේදී කාර්ය සාධන මට්ටම වැඩිදියුණු කරගැනීම සඳහා අපේක්ෂකයින්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

(1) ස්ව-අධ්‍යයන පාඩම් මාලා හොඳින් අධ්‍යයනය කර ඒවායේ අන්තර්ගත කරුණු තේරුම්ගත යුතුය.

(2) කළ යුතු ක්‍රියා පද නිර්වචනයන් තේරුම් ගැනීම සහ ප්‍රශ්න පත්‍රය අවසානයේ දී ඇති කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව මත පදනම්ව ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පුහුණු විය යුතුය.

(3) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වල අන්තර්ගත කරුණු අධ්‍යයනය කර අවම වශයෙන් ප්‍රශ්න පත්‍ර 2-3 කටවත් පිළිතුරු සැපයීමට පුහුණු වී ප්‍රශ්න ඉදිරිපත් කරන ආකාරය අවබෝධ කර ගත යුතුය.

(4) විභාගයට පෙර නියමිත කාලය වෙන් කරගෙන පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයා පුහුණු වීම මගින් විභාගයේදී කාලය කළමණාකරණයට ඉවහල් වේ.

(5) විභාගයේදී කියවීමට හැකි ආකාරයෙන් අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර, ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

(7) ප්‍රශ්න හොඳින් තේරුම්ගෙන ගැලපෙන හා නිවැරදි පිළිතුරු පිළිතුරු සැපයීම සඳහා විභාගය අවස්ථාවේදී පැහැදිලි මනසක් පවත්වා ගත යුතුය.

(8) එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය අනුව පිළිතුරු සැපයීමට ගත කළ යුතු කාලය වෙන් කර ගත යුතු අතර එමගින් සියළු ප්‍රශ්න සඳහා කාර්යක්ෂමව පිළිතුරු සැපයීමට හැකි වනු ඇත.

(9) පිළිතුරු පොත් භාරදීමට පෙර, අවශ්‍ය කරන සියළු ප්‍රශ්න වලට පිළිතුරු ලියා තිබේද, නිසි පරිදි අංක යොදා තිබේද ආදිය දෙවරක් පරීක්ෂා කර බැලිය යුතුය.

- * * * -